

# සිංහල සාහිත්‍ය සංග්‍රහය

# 11 ශ්‍රේණිය

## 11 පාඩම ඃ මග විසිතුරු

තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් සහ
සැළලිහිණි සන්දේශය පිළිබඳ තොරතුරු
වාර විභාගවලට අපේක්ෂිත
කෙටි ප්‍රශ්න, ලිහිල් බසින් ලිවීම,
විචාර ප්‍රශ්න සඳහා ආදර්ශ පිළිතුරු


විද්‍යාලයීය ආචාර්ය

**ලහිරු දරණකුඹුර**

0717042377 / 0779970906

## II පාඩම : මඟ විසිතුරු

## තොටගමුවේ ශ්‍රී රාහුල හිමිපාණන් වහන්සේ

"දෙමටාන" නම් ගමෙහි උපන් මෙතුමා කඳවුරු කුලයට අයත් වූ බව සහ නෑකමින් උත්තර මූල මහතෙරුන් වහන්සේගේ මුනුබුරු කෙනකු වූ බව පොතපතේ සඳහන් වේ. මෙතුමා තම කුඩා කාලය කෝට්ටේ රාජධානියේ ජයවර්ධනපුරයේ රජ කළ 06 වන පරාක්‍රමබාහු රජතුමාගේ රාජ මාලිගාවෙහි ගත කළ බැව් කියැවේ. 06 වන පරාක්‍රමබාහු රජතුමා මෙතුමන් ව තම පුතකු සේ සලකා හදා වඩා ගෙන ඇත.

කුඩා කල සිට ම කාව්‍යකරණයෙහි උපන් හපන්කම් දැක්වූ රාහුල හිමියෝ, අවුරුදු පහළොවේ දී කඳ සුරිඳුන්ගෙන් වරම් ලැබූ බවත් පැවිදි වීමෙන් පසු ව ඉතා විශාල දැනුම් සම්භාරයකින් යුක්ත ව අසාමාන්‍ය පාණ්ඩිත්වයක් ප්‍රකට කළහ. භාෂා හයක් කථා කළ හැකි වූ බැවින් "ෂඩ් භාෂා පරමේශ්වර" ගෞරව නාමයෙන් රාහුල හිමියන් ව හඳුන් වන ලද බවත් එතුමන් ම විසින් ලියන ලද ග්‍රන්ථ කිහිපයක සඳහන් වී ඇත. වීදාගම මෛත්‍රිය හිමියන් මෙතුමාගේ ගුරුහිමියන් වූ බව ඇතැම් අය පවසති. සංඝරාජ පදවියෙන් ද පිදුම් ලැබූ රාහුල හිමියන් තොටගමුවේ විජයබා පිරිවෙනෙහි පරිවේනාධිපති ව ද වැඩ වාසය කර ඇත. තව ද "ෂඩ් භාෂා පරමේශ්වර", "ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය", "තොටගමු විජයබා පිරුවන්පති", "රහල් වැඩිතැන්" යනාදි ගෞරව නාමවලින් උන්වහන්සේ ව හඳුන්වා ඇති බැව් පොත පතෙහි සඳහන් වේ.

"පරෙවි සංදේශය", "කාව්‍යශේඛර මහා කාව්‍යය", "සැළලිහිණි සංදේශය", "පංචිකා ප්‍රදීපය" සහ "බුද්ධිප්පසාදිනී ටීකාව" යන ග්‍රන්ථ එතුමන් විසින් රචනා කරන ලද ඒවා ය. කාව්‍ය, නාටක, නක්ෂත්‍රය, වෙදකම, යන්ත්‍රමන්ත්‍ර ආදී නොයෙකුත් ශාස්ත්‍ර සහ විද්‍යාවන් පිළිබඳ හසළ දැනුමක් තිබුණු රාහුල හිමියන් යක්ෂයින්ගෙන් පවා වැඩ ගත් බව ජනප්‍රවාදයේ දැක්වේ.

සිය ජීවිතයේ අවසාන කාලයේ දී වනවාසී ව ගල්ලෙනක වැඩ විසූ රාහුල හිමියන් පෙර කල "සිද්ධාලෝක" නම් බලසම්පන්න ඖෂධයක් වළඳා සිටි බැවින් එතුමන්ගේ අභාවයෙන් පසු ව ද දේහය නො දිරා තිබූ බවත් එකල ලංකාවට පැමිණි පෘතුගීසීන් එම දේහය ඔවුන්ගේ සාන්තුවරයකුගේ යැයි සිතා එය ඉන්දියාවේ ගෝව නගරයට ගෙන යන ලද බවත් ජනප්‍රවාදයේ දැක්වේ.

### ❖ සැළලිහිණි සංදේශය රචනා කිරීමට හේතු වූ කරුණ

**කෝට්ටේ රාජධානියෙහි රජ කළ 06 වන පරාක්‍රමබාහු රජතුමාගේ දෙවැනි දූ කුමරිය වූ උලකුඩය හෙවත් ලෝකනාථා කුමරියට පින්වත් පුත් කුමාරයකු ලබා දෙන ලෙස කැලණියේ විභීෂණ දෙවියන්ගෙන් ඉල්ලා සැළලිහිණියකු දූතයකු වශයෙන් යොදවා ගෙන යැවෙන අස්නක් ලෙස සැළලිහිණි සංදේශය රචනා වී ඇත.**

06 වන පරාක්‍රමබාහු රජතුමාගේ වැඩිමහලු දුව වූ චන්ද්‍රවතී කුමරියට සුදුසු ස්වාමියකු ලබා දෙන මෙන් ඉල්ලා දෙවිනුවර උපුල්වන් දෙවියන් වෙතට පරෙවියකු දූතයකු වශයෙන් යොදවා ගෙන යැවෙන අස්නක් ලෙස තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් පරෙවි සංදේශය රචනා කරන ලදී. එහෙත් එකී ඉල්ලීම ඉටු වීමට පෙර ම චන්ද්‍රවතී කුමරිය පරලෝකප්‍රාප්ත වූවා ය.

06 වන පරාක්‍රමබාහු රජතුමාගේ ඊ ළඟ බලාපොරොත්තුව රැඳී තිබුණේ උලකුඩය හෙවත් ලෝකනාථා කුමරිය වෙත ය. විවාහ වී සිටිය ද අනාගතයේ රජකම භාර ගැනීමට සුදුසු පුත් කුමාරයකු ඒ වන විට ද ඇයට ලැබී තිබුණේ නැත. කෙසේ හෝ රජතුමාගේ ආරාධනාවෙන් නැවතත් තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් එම අදහස ඉටු කර දෙන ලෙස ඉල්ලා සැළලිහිණියකු දූතයකු වශයෙන් යොදවා ගෙන කැලණියේ විභීෂණ දෙවියන් වෙතට යැවෙන අස්නක් ලෙස සැළලිහිණි සංදේශය රචනා කරන ලදී. එකී අයැදීම ඉටු වුණු අතර එය ලංකා ඉතිහාසය වෙනත් මගකට යොමු කළ වැදගත් සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැකි ය.

### ❖ සැළලිහිණි සංදේශය, සෙසු සංදේශ කාව්‍යයන්ට වඩා විශේෂිත වීමට හේතු

01) එම යුගයේ රචනා වුණු වෙනත් සංදේශ කාව්‍යයන් මෙන් නොව සැළලිහිණි සංදේශය ලිවීමේ අරමුණ ඉටු වූ අතර උලකුඩය හෙවත් ලෝකනාථා කුමරියට පුතකු බිහි වීම.

02) අඩු පද්‍ය සංඛ්‍යාවකින් යුක්ත වීම.

03) සැළලිහිණි සංදේශ කාව්‍යය ආරම්භයේ දී හැරුණු විට සෙසු සියලු ම පද්‍යයන් සමුදුරු ගොස් විරිතෙන් රචනා කර තිබීම.

04) දීර්ඝ වර්ණනාවලින් තොර ව කෙටියෙන් එහෙත් ශබ්ද රසයෙන් හා අර්ථ රසයෙන් අනූන සැළලිහිණි සංදේශය රචනා වී තිබීම.

05) ජයවර්ධනපුරයේ සිට කැලණිය දක්වා වූ ඉතා කෙටි දුරක් සැළලිහිණියා ගමන් කිරීම.





**01) පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

01) සන්දේශ කාව්‍ය යනු මොනවා දැ යි කෙටියෙන් හඳුන්වන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

02) සිංහල සන්දේශකරුවන් බොහෝ දුරට අනුගමනය කර ඇත්තේ කුමන සන්දේශකරුවන්ගේ කාව්‍ය ආකෘතිය ද ?

..............................................................................................................................................

03) සංස්කෘත දූත කාව්‍යවල ප්‍රධාන වසයෙන් දැකිය හැකි ලක්ෂණ 04ක් ලියන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

04) සිංහල සාහිත්‍ය වංශයෙහි දැනට දක්නට ඇති පැරණිතම සන්දේශ කාව්‍යය කුමක් ද ?

..............................................................................................................................................

05) එම සන්දේශ කාව්‍යය රචනා වුණු සාහිත්‍යමය යුගය කුමක් ද ?

..............................................................................................................................................

06) එම සාහිත්‍ය යුගයේ ම රචනා කරන ලදැ යි සැලකෙන තවත් සන්දේශ කාව්‍යයක් නම් කරන්න.

..............................................................................................................................................

07) සිංහල සන්දේශ කාව්‍යයේ ඉතිහාසය බොහෝ ඈත යුග දක්වා දිවෙන බවට අපට හමු වන ලිඛිත සාක්ෂි මොනවා ද ?

..............................................................................................................................................

..............................................................................................................................................

08) පහත පද්‍ය පාඨ උපුටා ගත් තැන් සඳහන් කරන්න.

අ) 'මොනරිඳු එකල්හි පුල් සලගැ නවා ගනී' - ...........................................................................

ආ) 'කලවන් බිඟු මහත් වත හිරු හත් වත' - ...........................................................................

ඇ) 'වන්දිමි හිමි වලා - තො ගොසින් ඇය නිවෙස්නට
පිරිබුන් පගා මලයුන - දිවොට හදහව කිය කියයි' - ...........................................................................

09) සන්දේශ කාව්‍ය ඉතිහාසයෙහි ලොව පළමුවරට සන්දේශයක් රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද ?

..............................................................................................................................................

10) ඔහු දූතයා වශයෙන් තෝරා ගත්තේ කුමක් ද ?

..............................................................................................................................................

11) සිංහල සන්දේශ කාව්‍යයන්ගේ ස්වර්ණමය යුගය කුමක් ද ?

..............................................................................................................................................

12) එම යුගය එලෙස සැලකීමට ප්‍රධාන හේතුව කුමක් ද ?

..............................................................................................................................................

13) සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන්නේ කුමන යුගය ද ?

..............................................................................................................................................

14) එම යුගය එලෙස සැලකීමට තුඩු දුන් හේතු මොනවා ද ?

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

15) කෝට්ටේ සාහිත්‍ය අවදියේ විසූ සාහිත්‍යධරයින් කිහිප දෙනකු නම් කරන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

16) කෝට්ටේ අවදියේ රචනා කරන ලදැයි සැලකෙන සන්දේශ කාව්‍ය නො වන වනත් සාහිත්‍ය ග්‍රන්ථ කිහිපයක් නම් කරන්න.

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

16) කෝට්ටේ සාහිත්‍ය අවදියේ රචනා කරන ලද සන්දේශ කාව්‍ය මොනවා ද ?

……………………………………………………………………………………

……………………………………………………………………………………

17) සැළලිහිණි සන්දේශයේ කතුවරයා කවුරුන් ද ?

……………………………………………………………………………………

18) උන්වහන්සේ ව එකල හඳුන්වන ලද ගෞරව නාම කිහිපයක් සඳහන් කරන්න.

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

19) තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් දැන සිටි ෂඩ් භාෂා නම් කරන්න.

……………………………………………………………………………………

20) තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචිත වෙනත් කෘති මොනවා ද ?

……………………………………………………………………………………

……………………………………………………………………………………

21) "**කඳවුරු කුල මැඳුරු මිණි පහනෙව් සුසැදී**
නැණගුරු සබස සමය ද දැනුමෙන් වොරැදී

……………………………………………

……………………………………………

අ) ඉහත දැක්වෙන කවියෙහි ඉතිරි පද්‍ය පේළි දෙක සම්පූර්ණ කරන්න.

ආ) තද කළු අකුරෙන් මුද්‍රිත පද්‍ය පේළියේ අර්ථය සරල බසින් ලියන්න.

……………………………………………………………………………………

22) සැළලිහිණි සන්දේශය ලිවීමේ අරමුණ කුමක් ද ?

……………………………………………………………………………………

……………………………………………………………………………………

23) සැළලිහිණි සන්දේශයේ මුළු කවි සංඛ්‍යාව කොපමණ ද ?

……………………………………………………………………………………

24) දූත ආශීර්වාදය සහ දස පද සැහැල්ලකින් යුතු දූත වර්ණනාව හැරුණු විට සැළලිහිණි සන්දේශයේ සෙසු කවි සියල්ල රචනා වී ඇති වෘත්ත කුමක් ද ?

……………………………………………………………………………………

25) සැළලිහිණි සන්දේශයේ පවතින සුවිශේෂතා කිහිපයක් සඳහන් කරන්න.

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

26) සැළලිහිණි සන්දේශයේ ගමන් අන්ත දෙක සඳහන් කරන්න.

……………………………………………………………………………………

26) තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් පිළිබඳ උන්වහන්සේගේ ම කෘතිවලින් හෙළිදරව් වන කරුණු කිහිපයක් සඳහන් කරන්න.

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

27) ඔබට නියමිත කවිවලට අනුව සැළලිහිණියා පසු කර යන ස්ථාන මොනවා ද ?

..................................................................................................................................................

..................................................................................................................................................

28) පාඩමට නියමිත කවිවලින් විස්තර වන්නේ කුමක් ද ?

..................................................................................................................................................

29) ඔබට නියමිත කවිවල ඇතුළත් උපමා මොනවා ද ?

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

30) ඔබට නියමිත කවිවල ඇතුළත් රූපක මොනවා ද ?

..................................................................................................................................................

..................................................................................................................................................

**02) පහත දැක්වෙන පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

1. සු ර ර ද සමන් සමගින් සුර'ඟන ඒ වර
**පැහැ න ද මදාරා පරසතු මල් පතර**
කැර පු ද වඳින රැඳි මුනි සිරි පා තඹර
සකි ස ඳ පෙනේ සමනොළ ගල නැගෙන හිර

ආ) මෙහි සඳහන් පරිදි සමනොළ කන්ද වන්දනා කිරීමට පැමිණෙන පාර්ශව කවරහු ද ?

..................................................................................................................................................

ආ) අංකිත පද්‍ය පාදයේ අර්ථය ලිහිල් බසින් ලියන්න.

..................................................................................................................................................

2. ග නේ මිණි බැබැළි කිරණෙව් සතපාය
ර නේ යට'ග සැවුලිඳු දද ගළපාය
අ නේ ලකර කළ පුර අප නරපාය
පෙ නේ දකුණැ මහසෙන් දෙව් රද පාය

අ) මෙහි සඳහන් පරිදි මහසෙන් දෙව් රද පාය අලංකාර වීමට හේතු දෙකක් දක්වන්න.

..................................................................................................................................................

ආ) මෙහි ඇතුළත් උපමාව උපුටා දක්වා එහි සරල තේරුම ලියන්න.

..................................................................................................................................................

3. **වල දිින අදහසින් මෙන් සුර ගඟ අඟන**
**නල බල සසල දළ රළ පෙළ නුබ නැගෙන**
වෙල ළස ගැවැසි මුතු සක් පබළු බබළන
බල මහ මුහුද එම සඳැ උතුරින් පෙනෙන

අ) මුල් පද්‍ය පාද දෙකෙහි අර්ථය සරල බසින් දක්වන්න.

..................................................................................................................................................

ආ) මෙම කවියෙහි විශේෂයෙන් ම ඉස්මතු වී පෙනෙන ශබ්දාලංකාරය කුමක් ද ?

..................................................................................................................................................

4. ස න් න න් සිහින් ගෙඩි සෙවණලු වැලි තෙලෙන
තැ න් තැ න් වල ම සැතැපී සියුමැලි බැවින
ර න් ව න් කරල් ගෙනැ එන ගිරවුන් අතින
ය න් ම න් තොසින් මඟ තොරතුරු නියම දැන

අ) මෙහි සඳහන් පරිදි සැළලිහිණියා සැතැපෙන්නේ කෙබඳු ස්ථානවල ද ?

..................................................................................................................................................

ආ) මෙම කවියෙහි අනුප්‍රාස රසය ගෙන දෙන පද සතර උපුටා දක්වන්න.

..................................................................................................................................................

5. නිල තුරඟුට නැඟෙමින් රිවි දෙවි සිරින
**දුල කැරැ සේසත් මිණි බරණ කිරණින**
බල පිරි සෙන් සහ යාපා පටුන් ගෙන
බල සේනානායක සපු කුමරු එන

ආ) මෙහි සඳහන් සපුමල් කුමරු පසු ව රාජ්‍යත්වයට පත් වන්නේ කුමන නමකින් ද ?

…………………………………………………………………………………………………………………………………

ආ) අංකිත පද්‍ය පාදයේ අර්ථය ලිහිල් බසින් ලියන්න.

…………………………………………………………………………………………………………………………………

6. අග පිපි මල් මලිගිය ලිය කැලේයා
වග බැඳැ හෙන රජ හස පුල් විලේයා
**ළඟ තුරු මල් ගිලිහුණු රොනවු'ලේයා**
**මඟ බැස යව පළ හෙළ වැලි තෙලේයා**

ආ) මෙම කවියට අනුව වනාන්තරයෙහි දක්නට ලැබෙන සිදුවීම් දෙකක් සරල බසින් ඉදිරිපත් කරන්න.

…………………………………………………………………………………………………………………………………

ආ) අවසාන පද්‍ය පාද දෙකෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

…………………………………………………………………………………………………………………………………

7. අයි රාවණ වුවත් නවතන රිසින් එන
<u>**අයි රා දුහස්**</u> දිලි දුනු කොත් සිපත් ගෙන
කයි කාවලෙහි දැකැ සෙබළුන් රැක සිටින
<u>**වයි යා කරන්**</u> මල් තුරු ගන වන හිසින

ආ) මෙහි සඳහන් සෙබළුන් සන්නද්ධ ව සිටින ආයුධ මොනවා ද ?

…………………………………………………………………………………………………………………………………

ආ) අංකිත පදවල අර්ථය ලිහිල් බසින් ලියන්න.

…………………………………………………………………………………………………………………………………

8. නිමල් සඳ පහන් වැනි වැලි පිට උදුළ
සුපුල් මල් යහන් ලිය මඬු ලිය ගෙ පෙළ
එකල් කෙළන වන දෙව් ලිය දැකැ කොමළ
**ළසල් රුකෙක සැතැපෙව ළපලු සිහිල'ළ**

ආ) මෙහි සඳහන් පරිදි කෝමළ වූ වන දෙව්ලියන් ක්‍රීඩා කරන්නා වූ ස්ථාන දෙකක් නම් කරන්න.

…………………………………………………………………………………………………………………………………

ආ) අවසාන පද්‍ය පාදයේ අර්ථය ලිහිල් බසින් ලියන්න.

…………………………………………………………………………………………………………………………………

9. ම ල් ද ම් සුවඳ දුම් දුන් සොඳ වරලසිනි
ක ල් ගි මි නිවා සැනැහෙන සිහිලස රසිනි
කො ල් ල මි ගසින් නිල් ඉවුරැ'ති පොකුණ'සිනි
ව ල් අ ම් බලම දැක යා ගන් සහතොසිනි

ආ) වල් අම්බලම පිහිටි ප්‍රදේශයෙහි දක්නට ලැබුණු ස්වාභාවික ලක්ෂණ දෙකක් ලියන්න.

…………………………………………………………………………………………………………………………………

ආ) කවියෙහි සඳහන් කාන්තාවන් තම කේශ කලාපය සුන්දර කර ගැනීමට යොදා ගත් උපක්‍රම දෙකක් ලියන්න.

…………………………………………………………………………………………………………………………………

10. කස්තුරි තිලක සැදි නළලත **සුමුටාන**
පුල් මහනෙල් මල් දම් හිස දවටාන
සලෙළුන් යනෙන නිති කැරැ කෙළි කවටාන
රිවි මුදුනත වන මැද වදු **සුමුටාන**

ආ) මෙහි සඳහන් පරිදි සලෙළුන් තම බාහිර අලංකරණය සඳහා කටයුතු කර ඇති ආකාර දෙකක් සඳහන් කරන්න.

…………………………………………………………………………………………………………………………………

ආ) මෙහි "සුමුටාන" නමැති පදයෙන් කියැවෙන අර්ථ දෙක අනුපිළිවෙළින් ලියා දක්වන්න.

…………………………………………………………………………………………………………………………………

11. ම ග නි ල මි න් සිටි නා දොඹ නී පියල
පි ය ස ල මි න් මලගෙහි කෙළෑ රොනින'වල
**ත තු ඩ ල මි න් බිඳෑ විලිකුන් මියුරු පල**
**ඉ සි ඹු ල මි න් යෙහි සැළ! දඹ පඳුරුවල**

ආ) මෙහි සඳහන් වන ශාක වර්ග සතරක නම් සරල බසින් දක්වන්න.

.......................................................................................................................................................

ආ) අංකිත පද්‍ය පාද දෙකෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

12. රි වි තැ වු ලේ පිපි කමලේ විල් ගැවැසී
ම ත කො වු ලේ තුරු වදලේ හඬන නිසී
ව න සැ වු ලේ මඟ අසලේ පොර සැලැසී
ගු රු බැ වු ලේ යව අවුලේ නොවී කිසී

ආ) ගුරුබැවුල නම් ප්‍රදේශයේ දී සැළලිහිණියාට දක්නට ලැබෙන සිදුවීම් දෙකක් සරල බසින් ලියන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

ආ) මෙම කවියෙහි විශේෂයෙන් ම ඉස්මතු වී පෙනෙන ශබ්දාලංකාරය කුමක් ද ?

.......................................................................................................................................................

13. ව න සි රි පියුම්රා බඳ රන'බරණ යුරු
ව ට පි රි සුපුල් දුනුකේ මල් මුරුත'තුරු
බි ගු පි රි වැරූ **ඔළු'පුලැ'ඹුලවල** තඹුරු
හි ම ස රි සිහිල් **දිය හෙබ** දැක යන් මිතුරු

ආ) මෙහි පළමු පද්‍ය පාදයේ සඳහන් උපමාව සරල බසින් ලියන්න.

.......................................................................................................................................................

ආ) අංකිත පදවල අර්ථය ලිහිල් බසින් ලියන්න.

.......................................................................................................................................................

**විචාර 01**

**සැළලිහිණි සන්දේශ කතුවරයා දූතයාට කරන මග වැනුම්වල දී ස්වභාවෝක්තියට මුල් තැනක් දෙන අයුරු පැහැදිලි කරන්න.**

ෂඩ්භාෂා පරමේශ්වර තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් කෝට්ටේ සාහිත්‍ය යුගයේ දී රචනා කරන ලද සැළලිහිණි සන්දේශයට නිමිත්ත වූයේ සවැනි පැරකුම්බාවන්ගෙන් පසු ව රජකම හෙබවීමට සුදුසු පුත්‍රරත්නයක් උලකුඩය දේවිය හට ලබා දෙන ලෙස කැලණියේ විභීෂණ දෙවියන්ගෙන් සැළලිහිණියකු ලවා ආයාචනා කරවීමයි. තත් යුගයේ බිහිවූ සෙසු සන්දේශ කාව්‍යයන්ට සාපේක්ෂව කෙටි ගමන් මඟකින් යුක්ත වූ බැවින් සැළලිහිණි අඩු පද්‍ය සංඛ්‍යාවකින් යුක්ත වේ. එහෙත් සංක්ෂිප්ත වුත් රසවත් වුත් කාව්‍ය සංකල්පනාවන්ගෙන් ගහණ සැළලිහිණි සන්දේශය ශ්‍රී රාහුල හිමියන්ගේ විශිෂ්ටතම කාව්‍ය නිර්මාණය ලෙස අවිවාදයෙන් පිළිගැනේ.

එහිලා රාහුල හිමියන් සැළලිහිණියා හට ඉදිරිපත් කරන මඟ වැනුම අතිශයින් චමත්කාරජනක, කාව්‍යෝක්තීන්ගෙන් ගහණ, සිතට ප්‍රිය උපදවන නිර්මාණයකි. මෙහි දී උන්වහන්සේ අතිශයෝක්ති වැනුමට වඩා ස්වභාවෝක්ති වැනුමට ප්‍රිය කොට ඇත්තාහ. සැළලිහිණියාට අතරමග දී දක්නට ලැබෙන ස්ථාන හා අත්විඳීමට ලැබෙන අත්දැකීම් සුලලිත මතු නොව අර්ථ පූර්ණ හා භාව පූර්ණ සංකල්පනාවන්ගෙන් සුපෝෂිත කරවීමට කටයුතු කොට ඇත.

''වලඳින අදහසින් මෙන් සුර ගඟ අඟන
නල බල සසල දළ රළ පෙළ නුබ නැගෙන
වෙළලසැ ගැවසි මුතු සක් පබළු බබළන
බල මහ මුහුද එම සඳැ උතුරින් පෙනෙන''

සැළලිහිණියා හට උතුරු දිශාවෙන් පෙනෙන්නට තිබෙන මහ මුහුදෙහි ගති ස්වභාවය කතු හිමියන් ඉදිරිපත් කරන්නේ ස්වභාවෝක්තියට මුල් තැන දෙමිනි. සුළඟේ බලයෙන් පණ පෙවුණු චණ්ඩ රළ පේළි අහස දෙසට එසැවෙන අයුරු ඉදිරිපත් කොට ඇතත්තේ අනුප්‍රාස රසය දනවමිනි. වෙරළ පුරා විසිරී පැවැති මුතු සක් පබළුවලින් ද කියා පාන්නේ එකල සිරිලක් වෙරළ තීරයෙහි පැවතියා වූ සුන්දරත්වයයි. අහස්ගඟ නැමැති කාන්තාව වැලඳ ගැනීමේ අදහසින් මෙන් දළ රළ පෙළ ඉහළට නැඟෙන බව දක්වා තිබුණ ද එම උපමාවෙහි කිසිදු අතිශයෝක්තියක් නොමැත; ඇත්තේ ස්වභාවෝක්තිය ම ය.

''මල් දම් සුවඳ දුම් දුන් සොඳ වරලසිනි
කල්ගිම් නිවා සැනැහෙන සිහිලස රසිනි
කොල්ලම් ගසින් නිල් ඉවුරැති පොකුණසිනි
වල් අම්බලම දැක යාගන් සහතොසිනි''

සැළලිහිණියා වල් අම්බලම පිහිටියා වූ ප්‍රදේශය පසුකර යන මොහොතේ දී දැක ගත හැකි යැයි පැවසෙන පරිසර වර්ණනාවකි, ඉහත කවියෙන් දැක්වෙනුයේ. මල්දම් හා සුවඳ දුම් සත්කාර ලද සොඳ වරලසින් යුතු මනහර කාන්තාවන් වෙහෙස නිවා ජල ස්නානය කරන කොල්ලම් ගසින් සැදුණු ඉවුරින් යුත් පොකුණක් අසබඩ මෙහි සඳහන් අම්බලම පිහිටියේ යැයි කතු හිමියෝ පවසා ඇත්තාහ.

''කස්තුරි තිලක සැදි නළලත සුමුටාන
පුල් මහනෙල් මල් දම් හිස දවටාන
සලෙලුන් යනෙන නිති කැරැ කෙළි කවටාන
රිවි මුදුනත වන මැද වදු සුමුටාන''

මධ්‍යහ්න වේලාවෙහි "සුමුටාන" නම් වන පියසට ඇතුළු වන සැළලිහිණියා හට දැකිය හැකි වන්නේ එහි නිතර යන එන විනෝදකාමී තරුණයන් ව ය. ඔවුන් කස්තුරි තිලක තම නළලතෙහි තබා පිපුණු මහනෙල් මල්වැල් හිසෙහි දවටාගෙන සිටි අයුරු රාහුල හිමියන් සඳහන් කොට ඇත. පරිසරය හා බැඳුණු මොවුහු තම ප්‍රකෘති ස්වභාවය එහි දී පළ කොට ඇත්තාහ.

''රිවි තැවුලේ පිපි කමලේ විල් ගැවැසී
මත කොවුලේ තුරු වදලේ හඬන නිසී
වන සැවුලේ මඟ අසලේ පොර සැලැසී
ගුරු බැවුලේ යව අවුලේ නොවී කිසී''

ස්වභාව සුන්දරත්වයෙන් අනූන, නොකිළිටි වන බිම් පෙදෙස්වලින් ගහණ ව පැවති කෝට්ටේ රාජධානි සමයෙහි ඉහතින් දැක්වෙන සුන්දරත්වයක් දක්නට ලැබෙන්නට ඇතැයි කීම අයුක්ති සහගත නොවේ. සූර්ය තාපයෙන් පිපුණු නෙළුම්න් යුත් විල්වලින් ගැවසුණු, මත් වූ කොවුලන්ගෙන් හා පොරට වැටී සිටින වනසැවුලන්ගෙන් යුත් වනාන්තර ප්‍රදේශවලින් එකල ගුරුබැවුල (හංවැල්ල) ප්‍රදේශය සපිරුණු බව සිතා ගැනීම එතරම් අසීරු කරුණක් නොවේ.

එබැවින් සිරි රහල් හිමියන් තම සඳෙසෙහි දූතයාට කරන මඟ වැනුම්වල දී අතිශයෝක්ති අලංකාරයට වඩා ස්වභාවෝක්ති අලංකාරය මුල් තැනක් දී ඇති බව එහි මඟ වැනුමෙහි එන ඉහත කවි නිදර්ශනයන්ගෙන් අපට මනා ව අවබෝධ වෙයි.

**<u>විචාර 02</u>**

**<u>ස්වභාව සෞන්දර්යය වර්ණනා කිරීම සඳහා කවියා භාවිතා කර ඇති කාව්‍යමය උපක්‍රම සාකච්ඡා කරන්න.</u>**

කෝට්ටේ සාහිත්‍ය යුගයේ දී තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් සවැනි පැරකුම්බාවන්ගේ දෙවැනි දියණිය වූ ලෝකනාථා කුමරිය හට පුත්‍ර රත්නයක් ලබා ගැනීමේ අරමුණින් කැලණියේ විභීෂණ දෙවියන් වෙත යැවෙන අස්නක් ලෙසින් සැළලිහිණි සන්දේශය රචනා කරනු ලැබ ඇත.

සිවු පද ආකෘතියට අනුගත වෙමින් සමුදුරුගොස් විරිතෙන් රචිත සැළලිහිණි සන්දේශය සංක්ෂිප්ත, එහෙත් කාව්‍යමය රසයෙන් අනූන රසවත් සාහිත්‍ය නිර්මාණයක් බැව් විචාරක අදහසයි. එය රසවත් වීම සඳහා රාහුල හිමියෝ විවිධ වූ කාව්‍යමය උපක්‍රම ප්‍රශස්ත මට්ටමින් යොදා ගෙන ඇත්තාහ.

ශබ්ද රසය දැනැවීම සඳහා එතුමෝ මුල, මැද සහ අග එළිසමය යෙදීමට කටයුතු කර ඇත්තාහ. මුල, මැද අග එළිසමය පිහිටුවීමට හැකිවන්නේ උසස් ගණයෙහිලා සැලකිය හැකි කවියන්ට පමණි. සැළලිහිණියේ මඟ වැනුමෙහි දැක්වෙන පහත කවිය ඊට කදිම නිදසුනකි.

''රිවි තැ<u>වුලේ</u> පිපි කම<u>ලේ</u> විල් ගැවැසී
මත කො<u>වුලේ</u> තුරු වද<u>ලේ</u> හඬන නිසී
වන සැ<u>වුලේ</u> මඟ අස<u>ලේ</u> පොර සැලැසී
ගුරු බැ<u>වුලේ</u> යව අ<u>වුලේ</u> නොවී කිසී''

සැළලිහිණියා හට "ගුරුබැවුල" නම් ප්‍රදේශයෙන් ගමන් කරන්නට පවසන රාහුල හිමියන් එහි දී දැකිය හැකි ස්වභාව සෞන්දර්ය වර්ණනා කිරීම සඳහා ඊට ම උචිත වූ සමුදුරුගොස් විරිත යොදා ගෙන ඇත. එහි දී මාත්‍රා 2,4,2,4 වශයෙන් යතිය පිහිටන පරිදි එළිසමය පිහිටුවා ඇත. අනුප්‍රාසය දැනවීම සඳහා එක ම ශබ්දය, එක ම අකුර නැවත නැවතත් යොදමින් සොබා සුන්දරත්වය අප හමුවෙහි චිත්‍රණය කරවීමට කතු හිමියන් දරා ඇති උත්සාහය පහත කවියෙන් මැනවින් පිළිබිඹු වේ.

''වලු දින අදහසින් මෙන් සුරඟන අඟන
නලු බලු සසලු දළු රළු පෙළු නුඹ නැඟෙන
වෙළුලුස ගැවැසි මුතු සක් පබළු බබළුන
බලු මහ මුහුද එම සඳ උතුරින් පෙනෙන''

උතුරු දිශාවෙන් පෙනෙන මහ මුහුදෙහි ස්වභාවය වර්ණනා කිරීම සඳහා 'ල' කාරය බහුල ව යොදා ගෙන ඇත. චණ්ඩ වූ රළ පේළි සුළඟේ බලයෙන් අහසට එසැවෙන අයුරු ශබ්ද රසය දැනැවෙන පරිදි ඉදිරිපත් කොට ඇත්තේ ''නල බල සසල දළ රළ පෙළ නුබ නැඟෙන'' යන යෙදුමෙනි. තව ද අර්ථ රසය දැනැවීම සඳහා ''සුරඟන අඟන'' (අහස නැමැති කාන්තාව) යන රූපකය යොදා ඇත. තව ද මඟ වැනුමෙහි යෙදෙන "සමනල කන්ද" පිළිබඳ ව වර්ණිත කවියෙහි ''මුනි සිරිපා තඹර'' හා වනාන්තර අසිරිය පිළිබඳ දැක්වෙන ''වනසිරි පියුම් රා බඳ රන බරණ යුරු'' යන කවියෙහි ''වනසිරි'' (වනය නැමැති සිරි දෙව් දුව) යන යෙදුම් ද රූපක අලංකාර වේ.

උපමා අලංකාරය ද නො අඩුව මඟ වැනුම සඳහා රාහුල හිමියන් භාවිත කොට ඇත. එබඳු අවස්ථා කිහිපයක් ම නියමිත කවි පෙළෙනි අපට හමුවේ.

''ගනේ මිණි බැබළි කිරණෙව් සතපාය''
''නිල තුරඟුට නැඟෙමින් රිවි දෙව් සිරින''
''නිමල් සඳ පහන් වැනි වැලි පිට උදුල''
''වනසිරි පියුම්රා බඳ රන'බරණ යුරු''
''හිමසරි සිහිල් දිය හෙබ දැක යන් මිතුරු''

"සූර්යයාගේ රැස් මෙන් බබළන කිරණෙන් යුතු ගන මාණික්‍ය", "සූර්යයාගේ අසිරියෙන් කළු පැහැ අශ්වයෙකු පිට නැඟී පැමිණෙන සපුමල් කුමරු", "නිර්මල සඳ කිරණ වැනි බබළන වැලි තලාව", "වනය නැමැති සිරිදෙව් දුවගේ ගෙලෙහි බඳින ලද පද්මරාග මාණික්‍යමය රන් ආභරණයක් වැනි", "හිම මෙන් සීතල ගැඹුරු ජලාශ" ඉහත උද්ධෘතයන්ගේ සරල අර්ථයයි. රාහුල හිමියන් රසික සහෘදයන්ගේ සිත්හි රසය ඇති කරවමින්, සංකල්ප රූප මවමින් ස්වභාව සුන්දරත්වය වැනීම සඳහා උපමා බහුල ව යොදා ගෙන ඇත.

''මඟ නිලමින් සිටි නා දොඹ නී පියල
පිය සලමින් මලගෙහි කෙළෑ රොනින'වල
ත'තුඬලමින් බිඳැ විලිකුන් මියුරු පල
ඉසිඹුලමින් යෙහි සැළ, දඹ පඳුරුවල''

ස්වභාව සුන්දරත්වය වර්ණනයට රාහුල හිමියන් යොදා ගෙන ඇත්තේ අපූර්ව වූ කාව්‍ය සංකල්පනාවන් ය. ළපටි සියුමැලි එතුමන් සැළලිහිණියා හට ආරාධනා කර ඇත්තේ මාර්ගය දෙපස ඇති නා, දොඹ, බක් මී, මොර යන ගස්වල පිපී ඇති මල් මත ක්‍රීඩා කරමින් රොනින් නැහැවෙන්නට ය. අනතුරු ව ඒවායේ මියුරු පල තම තුඬ යොදා බුදින්නට ය. ඉන්පසු ජම්බු පඳුරුවල නැවැතී මඳ විවේකයක් ලබන්නට ය. එහි දී උන්වහන්සේ ශබ්ද රසය හා අර්ථ රසය සම සම ව සුසංයෝජනය කරමින් රචනා කොට ඇති ඉහත කවිය උන්වහන්සේ සතුව තිබූ රසවත් කාව්‍ය නිර්මාණ ශක්තිය ඉතා හොඳින් ප්‍රදර්ශනය කරවන්නකි.

ආකෘතිය, විරිත, එළිවැට, අනුප්‍රාසය, උපමා හා රූපක අලංකාරය, රසවත් වූ කාව්‍ය සංකල්පනා යනාදී කාව්‍යමය උපක්‍රම මඟින් තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් සිය කාව්‍ය නිර්මාණය ශබ්ද රසයෙන් හා අර්ථ රසයෙන් පිරවීමට දරා ඇති උත්සාහය සැළලිහිණියේ එන මඟ වැනුමට අයත් කවිවලින් අපට පෙන්වා දිය හැකි ය.

ලහිරු දරණකුඹුර
2016.05.12